# ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் திணைக்களம்
## LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகறீஸ் மாவத்தை, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / தொலைநகல் / Fax : 684051

ඊමේල් / மின்னஞ்சல் / E-mail : Landcom@sltnet.lk


අංක/2003/09.

මගේ අංකය / எனது இல / MY NO : 5/2/6/රත්තගුම්

ඔබේ අංකය / உமது இல / YOUR NO :

දිනය / திகதி / DATE : 2003.06.12.

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

<u>දැනට ලියාපදිංචි කර ඇති දීමනා පත්‍ර , දීමනා පත්‍ර ලාභීන් වෙත බෙදාදීම</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර පිළියෙල කිරීම යන මාතෘකාව යටතේ ඔබ අමතා ඇති මගේ 2002/1/7 දිනැති අංක 2002/01 දරණ චක්‍ර ලේඛයටද, උක්ත මැය යටතේ ඔබ වෙත එවා ඇති 2002.05.20 දිනැති අංක 2002/02 දරණ චක්‍ර ලේඛයට හා 2002.08.08 දිනැති අංක 2002/06 දරන චක්‍ර ලේඛයටද ඔබේ අවධානය යොමු කරවමි. එම චක්‍ර ලේඛ මගින් <u>දීමනා පත්‍ර බෙදා දීම සම්බන්ධව නිකුත් කර තිබූ උපදෙස් මෙයින් අත්හිටුවමි.</u>

අතිගරු ජනාධිපති තුමිය විසින් අත්සන් කරන ලදුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති දීමනා පත්‍ර අදාළ කට්ටි කරුවන්ට භාරදෙන ලෙසද, එසේම අතිගරු ජනාධිපති තුමිය අත්සන් කර ඇති එහෙත්, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර නැති දීමනා පත්‍ර ද, ලියාපදිංචි කර අදාළ කට්ටි කරුවන්ට බෙදාදීමට පියවර ගන්නා ලෙස ඉඩම් ලේකම්ගේ අංක.එල්ඩී 4/5 හා 2003.06.12 දිනැති ලිපියෙන් මාවෙත දන්වා ඇත.

එහෙයින් දැනට ඔබ කාර්යාලයේ ඇති දීමනා පත්‍ර ඉහත සඳහන් උපදෙස් පරිදි දීමනා පත්‍ර ලාභීන් වෙත බෙදාදීමට කටයුතු කරන්න.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස්.

පිටපත්.

1 ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
2 සියළුම දිසාපති/දිසාලේකම් වරුන්,
3 සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන්,
4 සියළුම නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් වරුන්,

ඉ/12